# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2202/2- 2020 නොවැම්බර් මස 16 වැනි සඳුදා - 2020.11.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/ පරවශතාවේ විස්තර*:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පස්බාගේ කෝරළේ සුළු කොට්ඨාසයේ කොට්ඨාස අංක 1097 කැන්දෝපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හයින්පෝඩ් ජනපදය ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික්කයේ මිනින්දෝරු අධිකාරි විසින් 2020.09.07 වන දින සකස් කර ඇති මූ.පි. මහ 6999 හි:

**කැබලි අංක 1**

ඉඩමේ නම: හයින්පෝඩ් වත්ත; ප්‍රමාණය: හෙක්. 2.5326

*උතුරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *නැගෙනහිරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කැබලි අංක 2; *දකුණට* : කැබලි අංක 2 සහ වතු පාර; *බටහිරට* : වතු පාර සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).

**කැබලි අංක 3**

ඉඩමේ නම: හයින්පෝඩ් වත්ත; ප්‍රමාණය: හෙක්. 3.6548

*උතුරට* : කැබලි අංක 2 සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *නැගෙනහිරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *දකුණට* : මු. පි. ඒ 1120හි 34 වැනි බිම් කැබැල්ල, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හයින්පෝඩ්වත්ත සහ වතු පාර; *බටහිරට* : වතු පාර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හයින්පෝඩ්වත්ත සහ කැබලි අංක 2.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2021 ජනවාරි මස 20 වැනි දින පෙ. ව. 10.00 ට නාවලපිටිය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2021 පෙබරවාරි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. කේ. අමරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
පස්බාගේ කෝරළේ - නාවලපිටිය.

2020 නොවැම්බර් මස 11 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
පස්බාගේ කෝරළේ - නාවලපිටිය.

11 - 372

1A - G 33118 – 20 (2020/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධිපත්‍රිකාව

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

*මගේ අංකය* : BD/BD/LND/3/5/18-940.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව අංක 1979/29 හා 2016.08.10 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමේ 7A පිටුවෙහි සඳහන් අවසාන ගම් පිඹුරු අංක 80 - අතිරේක 55 - පත්‍ර අංක 51ට අදාළ කැබලි අංක 825 නැවත අවසාන ගම් පිඹුරු අංක 80 - අතිරේක 59 - පත්‍ර අංක 55ට අදාළ කැබලි අංක 940 - ප්‍රමාණය හෙක්ටයාර් 0.0005ක් ලෙස මිනුම් කර ඇත. එම මිනුම නැවත අවසාන ගම් පිඹුරු අංක 80 - අතිරේක 66 - පත්‍ර අංක 62හි කැබලි අංක 1097 හා 1098 ලෙස විභජනය වී ඇත.

**කැබලි අංක 940 විභජනය**

**කැබලි අංක 1097 - ප්‍රමාණය - හෙක්ටයාර් 0.0004**

ඉඩමේ නම: බත්නක්ගෙදරවත්ත, වරිපනම් අංකය - 324/1, පස්සර පාර; වර්තමාන ඉඩම් පරිහරණය: මුඩුබිම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: අංක 84, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල හි පදිංචි වෙදසිංහ ආරච්චිලාගේ පත්මශීලි ජයලතා ද සිල්වා, අ.ග.පි. 80 කැබලි (කොටස්) අංක 940;

**කැබලි අංක 1098 - ප්‍රමාණය - හෙක්ටයාර් 0.0001**

ඉඩමේ නම: බත්නක්ගෙදරවත්ත, වරිපනම් අංකය - 324, පස්සර පාර; වර්තමාන ඉඩම් පරිහරණය: මුඩුබිම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: අංක 84, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල පදිංචි වෙදසිංහ ආරච්චිලාගේ ශාන්ති ද සිල්වා, අ.ග.පි. 80 කැබලි (කොටස්) අංක 940;

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2020 ඔක්තෝබර් මස 06 වැනි දින
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

11-373

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.